ET/SSS/2022(2023)/OL/21/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Sinhala Language and Literature

# සිංහල භාෂාව හා සාහිත්‍යය



**Question Paper - I, II, III | ප්‍රශ්න පත්‍රය - I, II, III (සිංහල මාධ්‍යය)**

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 21 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II,III**
**சிங்களமொழியும் இலக்கியமும் I, II,III**
**Sinhala Language and Literature I, II,III**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
* අංක **1 - 40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. රටේ ප්‍රශ්න හමුවේ **මුනිවත රැකීම** උගතුන්ගේ කාර්යයක් නොවේ.
   (1) නැසූ කන් ව සිටීම (2) නිහඬ ව සිටීම
   (3) අදහස් නොදැක්වීම (4) වත් පිළිවෙත් රැකීම

2. තම ආයතනයට **පස්ස දොරෙන්** සේවකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් සේවකයෝ විරෝධය පෑහ.
   (1) රහසිගත ව (2) විධිමත් ව
   (3) අයුතු ලෙස (4) සුදුසුකම් නොමැති

3. අවංක ව කැප විය නොහැකි නම් **නම්බු පිටින්** සේවය අතහැර යන්නැයි බලධාරියා නව පත්වීම්ලාභීන්ට පැවසුවේය.
   (1) අවනම්බු නොවන සේ (2) නම්බුකාර ලෙස
   (3) අපකීර්තිය මගහැර (4) වැදගත් අන්දමින්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. රාජ්‍ය ආයතනවල ...................... ක්‍රියාවලියෙහි පවත්නා දුර්වලතා කෝප් කමිටුව මගින් අනාවරණ කෙරිණි.
   (1) ප්‍රතිපාදන (2) ප්‍රතිස්ථාපන
   (3) ප්‍රති අපනයන (4) ප්‍රසම්පාදන

5. සොබා දහම වර්ණනා කිරීම ................... කරගත් කාව්‍ය නිර්මාණ කොළඹ කවියට ආගන්තුක නොවීය.
   (1) මුඛ්‍යාර්ථය (2) යථාර්ථය
   (3) ව්‍යංග්‍යාර්ථය (4) ධ්වනිතාර්ථය

6. හදිසි සැත්කමක් සඳහා රෝගියා ................... වෙත යොමු කෙරිණ.
(1) ඖෂධාගාරය (2) චිකිත්සාගාරය
(3) ශල්‍යාගාරය (4) නේපථ්‍යාගාරය

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ස්වභාවික, රිද්මයානුකූල, ගැහැණිය, වෙළෙඳපොළ
(2) ලොකු ලූනු, තුෂ්ණිම්භූත, න්‍යෂ්ටිය, ගනුදෙනු
(3) අවස්ථෝචිත, කල්‍යාණ, පරිපීඩිත, යුහුසුළු
(4) සාමර්ථ්‍යය, සමතුලනය, පුනරීක්ෂණ, සළකුණ

8. තරුණ, කුටිය, දැහැමි, සමාන යන වචනවල **දෙවන අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල
(2) කෙටි ඇදය, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, කෙටි ඇදය
(3) කෙටි ඇදය, කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල
(4) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඇදය, කෙටි ඉස්පිල්ල

9. 'බමරා' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වනුයේ,
(1) කණ්ඨජ හා ඕෂ්ඨජ (2) මූර්ධජ හා තාලුජ
(3) තාලුජ හා දන්තජ (4) ඕෂ්ඨජ හා මූර්ධජ

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අඩුව, ඇල්ල, උදුන, උද්‍යානය
(2) කාලය, කුඹුර, වියන, සළුව
(3) විමිනිය, දුන්න, බඳුන, වීදුරුව
(4) ගෙඩිය, දැහැටි, ඩක්කුව, හවන

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) හාවෙක්, ගැරඬින්, ගිරවු, විද්‍යාඥයන්
(2) මොවුන්, සැකකරුවෙක්, විනිසුරුවෝ, සේවිකාවක
(3) ශිල්පීන්, ගුරුවරියෝ, අශ්වයන්, මාගමුන්
(4) මගියකු, වලසුන්, නරඹන්නන්, කුමරියක

12. 'දරුවාගේ අතින් ගිලිහුණු සරුංගලය ඈත අහසේ පාවී ගියේ ය' යන වාක්‍යයෙහි **'අතින්'** යන පදයෙහි විභක්තිය කුමක් ද?
(1) අවධි (2) කරණ (3) සම්බන්ධ (4) ආධාර

13. 'ජනප්‍රිය' යන්න අයත් වනුයේ
(1) විශේෂණ සමාසයට ය (2) විභක්ති සමාසයට ය
(3) අන්‍යාර්ථ සමාසයට ය (4) අව්‍යය සමාසයට ය

14. සාහිත්‍ය + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සාහිත්‍යික (2) සාහිත්‍යයික
(3) සාහිත්‍යික (4) සාහිත්යික

15. මුලින් දැක්වෙන ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) නිපාත - හෙවත්, බැවින්, අනේ, පිණිස
(2) තද්ධිත - සාධුතර, ප්‍රියතම, නාවික, දේශීය
(3) කෘදන්ත - දකින, පැමිණිලි, දරුණු, වැඩුණ
(4) විශේෂණ - හෙමින්, මිහිරි, දක්ෂ, ලොකු

16. **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) බොහෝ පිරිසක් පොත් ප්‍රදර්ශනය නැරඹීමට එති.
   (2) දැරියක් ගීයක් මුමුණමින් නැටුවා ය.
   (3) පස් කන්දක් නාය යැමෙන් ගමනාගමනය අඩාළ විය.
   (4) අපි කණ්ඩායම් දෙකකට බෙදී තරග කෙළෙමු.

- **17** සිට **19** තෙක් ප්‍රශ්නවල තද **කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය වඩාත් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ක්‍රීඩිකාවන් තුළ තිබූ විශේෂ **නෛපුණ්‍යය** තරග ජයග්‍රහණයට හේතු විය.
   (1) දක්ෂ බව (2) නිපුණ බව
   (3) ප්‍රගුණ බව (4) සුදුසු බව

18. මඩෙහි ගිලුණු **වරණිඳු** ගොඩ ගත හැක්කේ එවැනි බලවන්තයකුට ම පමණි.
   (1) සිහ රජ (2) දෙව් රජ
   (3) ඇත් රජ (4) සක් රජ

19. කාව්‍ය රචකයා තම **අධ්‍යාශය** කොතෙක් දුරට ඉටුකර ගැනීමට සමත් වී ඇත් ද යන්න සාහිත්‍ය විචාරයේ දී වැදගත් වේ.
   (1) අදහස (2) අරමුණ
   (3) තේමාව (4) ක්‍රියාදාමය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   (1) තේ, කිරි, හකුරු, ලුණු
   (2) මල්, පහන්, පැන්, සුවඳදුම්
   (3) පාර, වාහන, ඉන්ධන, මගීන්
   (4) වහල, බාල්ක, වඩුවා, ඇණ

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ප්‍රකට - පරසිඳු | වාරි - ජලය | පුස්තක - පුවත්පත | කලදෝ - රිදී |
| (2) | චන්ද්‍රයා - සිසි | උවදුර - පිරිපත | මව්තය - පුදුමය | විහඟ - කුරුලු |
| (3) | විඩාව - වෙහෙස | මුකුලිත - පිපුණු | මෙරමා - අනුන් | වැනි - එව් |
| (4) | උතුම් - අග්‍ර | ගර්වය - වීර්යය | හේම - රන් | සුළඟ - අනිල |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) මව - මෑණි, දිනිති, අම්මා, අම්දිනි
   (2) සතුට - ප්‍රීතිය, හර්ෂය, සොම්නස, ප්‍රමෝදය
   (3) සිරුර - තුනු, කය, උර, බඳ
   (4) ස්ත්‍රිය - අඟන, លිය, නාරි, කත

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
   (1) ආරක්ෂිත - සුරක්ෂිත (2) පිවිසීම - පිටවීම
   (3) සම්මාන - අවමාන (4) සංකෝචන - විස්තාරණ

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) ඔබ යනු මධ්‍යම පුරුෂ සර්ව නාම පදයකි.
(2) හැම ක්‍රියා පදයක් ම අවසාන ක්‍රියා වේ.
(3) අන්ත:ස්ථාක්ෂර සඳහා අර්ධස්වර නාමය ද යෙදේ.
(4) තද්ධිත හා කෘදන්ත නාම ප්‍රත්‍යයාර්ථ නාම ලෙස ගැනේ.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) ඩෙංගු වසංගතය හේතුවෙන් යළි ව්‍යාප්තිය මහජන සෞඛ්‍යයට තර්ජනයක් වේ.
(2) නොරොච්චෝලේ බලාගාරය අක්‍රිය වීම විදුලිය කැපීම නිසා සිදුවන්නක් බව පැවසේ.
(3) දිනෙන් දින උග්‍ර වන ළමා මන්දපෝෂණය පිටුදැකීමට වැඩපිළිවෙළක් සැකසිය යුතු වෙයි.
(4) රටේ සංවර්ධනය තරුණ අදහස්වලින් උකහා ගැනීම අත්‍යවශ්‍ය සාධකයකි.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. වුවමනා දේ ඇතොත් එයින් ඕනෑ ම දෙයක් කළ හැකි බව
(1) කිරියෙන් කාලා පැණියෙන් අත සේදුවා වගෙයි
(2) චක්‍රවර්ති රාජ්‍යයක් පහළ වුණා වගෙයි
(3) හකුරු ඇත්නම් කොයි ළිඳෙත් වතුර පැණි රසලු
(4) කොණ්ඩෙ ඇත්නම් කොහොම බඳින්න බැරි ද

27. තමන් පිළිකුල් කරන දෙයක් වෙනත් ක්‍රමයකින් කිරීම
(1) බළලුන් ලවා කොස් ඇට බාවන්නා වාගෙයි
(2) ආඳ මාලු පොල් ඉරටෙන් කන්නා වාගෙයි
(3) නරියාට කුකුළු කොටුව බාර දුන්නා වාගෙයි
(4) එපා වාහෙට හොදි බෙදන්නා සේ

28. පරස්වර ලෝප සන්ධියට හා ද්විත්ව රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පුදසුන, පත්තිරු (2) ඇද්දළ, දෙවුර
(3) සුරත, අතිනත (4) අම්මල්, ගිනියම්

- **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) සියලු ම ළමයි දේශනයට සවන් දුන් බව ගුරුවරු පැවසූහ.
(2) පුරවැසියෝ තම වගකීම් ඉටු කළ යුතු ය.
(3) ගර්භිණී මාතාවන් සෞඛ්‍ය සායනයට සහභාගි වී ඇත.
(4) නව නිපැයුම් පෙළ වෙළෙඳපොළට නිකුත් කෙරෙති.

30. (1) ලෝකෝපකාරය රචනා කළේ රණස්ගල්ලේ හිමියන් විසිනි.
(2) අන්තර්ජාලය අධ්‍යාපන ක්‍රියාවලියට උපකාර වන්නාහ.
(3) ලේකම්වරිය නොහොත් සභාපතිවරයා සභාව අමතන්නී ය.
(4) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමට තුඩුදෙන හේතුහු බොහෝ වෙති.

31.

- ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගි වන ............... කාරුණිකව ආරාධනා කර සිටිමු.
- ඇතා පෙරහැරට ගෙන යනු .............. අලංකාර ලෙස සරසන ලදි.
- නිලධාරිහු ගොවීන් .............. සාකච්ඡාවේ නිරත වූහ.
- රස ........... වැකිය සාහිත්‍යය නම් වන්නේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක්ද?

(1) ලෙස, වස්, සමග, සහිත (2) ලෙස, වස්, සහිත, සමග
(3) වස්, ලෙස, සමග, සහිත (4) වස්, සමග, සහිත, ලෙස

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් **නිවැරදි** වන්නේ කුමක් ද?

"මට ඒක අදහා ගන්න බෑ"

(1) මට එය පිළිගැනීමට බැරි ය.
(2) මට ඒක විශ්වාස කිරීමට අමාරු ය.
(3) මට එය අදහාගත නොහැකි ය.
(4) මට එය අදහා ගැනීමට බැරි ය.

33. පහත සඳහන් ගීත ඛණ්ඩයේ තුන්වන පදය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
.......................................................
ඔබ පොළොවට බරකි පුතේ

(1) මවුබිම දෙස බලන් පුතේ
(2) දහදිය නොම සැලෙන ගතේ
(3) ඉදි කළ වැව් බලන් පුතේ
(4) සුරුවිරුකම් ඔබට ඇතේ

34. "සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථාන්විත අනුභූතීන් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇති වන සේ නැවත ඉදිරිපත් කරන ආකාරයෙනි. "

ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව කියැවෙන වාක්‍යය තෝරන්න.

(1) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලි ගුණය පිළිබිඹු කෙරෙන්නේ ඔහු තුළ ඇති අර්ථාන්විත භාවයත් රස වින්දනයත් ඉදිරිපත් කිරීමේ ශක්‍යතාවත් නිසා ය.
(2) අර්ථවත් අත්දැකීම් තෝරා ගෙන ඒවා පාඨකයා තුළ වින්දනීය බවක් ඇති වන සේ ප්‍රතිනිර්මාණය කිරීමෙන් සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය පළ කෙරේ.
(3) අර්ථවත් අත්දැකීම් තෝරා ගෙන ඒවා පාඨකයා වෙත යළි රස වින්දනාත්මක ව ඉදිරිපත් කිරීමට සාහිත්‍යකරුවා ප්‍රෝත්සාහි විය යුතු ය.
(4) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය මගින් අර්ථවත් අත්දැකීම් වෙත පාඨකයා සමීප කෙරේ.

35. පුර යෝනන් වුවන් - නුවන් පිළිබිඹු දිස්නා
මිණි කැට බිතෙ පුරවරේ - පියුමුපුලවුල් විල් පෑ

ඉහත ගීය අන්තර්ගත කාව්‍ය කෘතිය කුමක් ද?

(1) කාව්‍යශේඛරය (2) සුභාෂිතය
(3) සසදාවත (4) මුවදෙව්දාවත

36. “යකෝ මේ මනුස්සය එක පාරට ම කරන්න කල්පනා කරල තියෙන්නෙ අමුතුම තාලෙ වැඩක්නේ”
මේ ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?
(1) වතුර මල (2) මං තනන්නෝ
(3) තල මල පිපිලා (4) හුණුවටයේ කතාව

37. උපමාවක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) ගැබ් වුණ සිසිල එයි ඊතල පරිදි මෙහේ
(2) සින්ධූපමාන වැව් තලා මතින් නැගී
(3) දෙව්ලෝ සිරිය පෙර අප සිරිලකෙහි ලදී
(4) රිවිබිම්බායුරු රිවිකුල කමලකර

38. “ එකල්හි අනඳ මහතෙරහු බුදුන් කෙරෙ බලවත් සෙනෙහයෙන් අධිවාසනා නො කටැහී.........” යන පාඨයෙහි අධිවාසනා යන්නෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) අධිෂ්ඨානය (2) ඉවසීම
(3) වාසනාව (4) පුණ්‍යවන්තභාවය

39. පහත සඳහන් ප්‍රකාශ අන්තර්ගත පාඩම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

★ ඔන්න ඔච්චා අමතක කරමු ලොකු අත්තෙ
★ උඹට හුහක් හයිය තියෙනවානේ ළමයෝ
★ ඒ මිනිස්සු කඩේට ගිහින් බොන්නැතෑ
★ එහෙම සෝමාරිකමක් පේන්නෙ නෑ මට

(1) තොරොක්කෝව, මං තනන්නෝ, හුණුවටයේ කතාව, තල මල පිපිලා
(2) මං තනන්නෝ, හුණුවටයේ කතාව, තල මල පිපිලා, තොරොක්කෝව
(3) හුණුවටයේ කතාව, තල මල පිපිලා, තොරොක්කෝව, මං තනන්නෝ
(4) තල මල පිපිලා, තොරොක්කෝව, මං තනන්නෝ, හුණුවටයේ කතාව

40. සත් කෝරළේ උපභාෂාවේ හේන් කෙටීම සඳහා යෙදෙන ව්‍යවහාරය වනුයේ
(1) පැල පදියම් වීම ය (2) පිලි හොඳ වීම ය
(3) වල් ඇල්ලීම ය (4) කෙකිනිපත් ගැසීම ය

(ලකුණු : 1 x 40 )

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 21 | S | II |
|---|---|---|

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II,III
சிங்களமொழியும் இலக்கியமும் I, II,III
Sinhala Language and Literature I, II,III

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය II**

- ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත දැක්වෙන පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) දළ (ආ) දල

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) දඩයම් (ආ) සිවුරඟ

(iii) පහත දී ඇති පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කරන්න.
(අ) කෞශල්‍යය (ආ) සැලකිලි

(iv) පහත දැක්වෙන කාව්‍ය ඛණ්ඩයෙහි ඇතුළත් නිපාත පදයක් හා උපසර්ග පදයක් උපුටා දක්වන්න.
නො විතර තෙද බලැති මහතුන් හට පවර

(v) පහත පදවල අනුක්ත රූප ලියන්න.
(අ) උතුමාණෝ (ආ) ශිෂ්‍යාවක්

(vi) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය ලියන්න.
(අ) කිරිබත් (ආ) ගුණසයුර

(vii) 'බොයි ' යන පදය ඇසුරෙන් පහත දැක්වෙන ක්‍රියා පද සකස් කරන්න.
(ආ) මිශ්‍ර ක්‍රියා පදයක් (ආ ) අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා පදයක්

(viii) උඩරට උපභාෂාවට අයත් පහත ව්‍යවහාර සඳහා යෙදෙන පොදු වහර ලියන්න.
(අ) ඇම්බරයා (ආ) කේලම්කාරයා

(ix) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) දූපතේ සැඟවී සිටි ආගන්තුකයා අප දකියි.
(ආ) විශේෂඥ වෛද්‍යවරු ප්‍රතිජීවක ඖෂධ පිළිබඳ පර්යේෂණ කළහ.

(x) පහත දැක්වෙන ඉඟිවැකිවල අර්ථය ලියන්න.
අ) හමස් පෙට්ටියට දැමීම ආ) ඉරහඳ හා සටන් වැදුණු (ලකුණු 02 X 10 =20 යි)

2. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන **250කට නොඅඩු වන** සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තය ප්‍රමුඛ වශයෙන් ජීවනෝපාය කර ගත් රටකි. අතීත රජවරු වාරි තාක්ෂණය යොදා ගනිමින් අහරින් රට ස්වයංපෝෂිත කළහ. එමෙන්ම ම අප රටින් විදෙස් රටවලට සහල් ඇතුළු නිෂ්පාදන අපනයනය කළ බව ද ඉතිහාසයෙහි සඳහන් වෙයි. එහෙත් අද වන විට ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද ආහාර අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. මේ සඳහා කඩිනම් විසඳුම් සෙවීම විෂයෙහි සාමූහික ප්‍රයත්නයක යෙදීමට කාලය එළඹ ඇත.

(ආ) වර්තමාන ලෝකයේ බොහෝ රටවල් බලශක්ති අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. එනිසා උද්ගත වී ඇති ගැටලු අතිශය සංකීර්ණ තත්ත්වයට පත් වෙමින් පවතියි. එකී අර්බුදයට බලපා ඇති ආර්ථික, සමාජීය හා සංස්කෘතික සාධක බොහොමයකි. එබැවින් විකල්ප බලශක්ති ප්‍රභේද කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත ය. එහි දී පාරිසරික සමතුලිතතාව කෙරෙහි ද සැලකිලිමත් වීම අනිවාර්ය වේ.

(ඉ) වර්තමාන සමාජයේ නිරෝගිකම පවත්වා ගැනීමට යොමු වන අවධානය අල්ප වී ඇත. එය බෝ වන සහ බෝනොවන රෝග ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීමට ද ඍජුව ම බලපා තිබේ . නිසි සෞඛ්‍ය පුරුදු අනුගමනය නොකිරීමත් ඒ පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැති වීමත් ඊට බලපා ඇති ප්‍රධාන සාධක වේ . නිරෝගිකම පරමලාභය ලෙස සලකන සමාජයක් බිහි කිරීමට ඇප කැපවීම සියලු දෙනාගේ ම වගකීමකි.

(ඊ) නිර්මාණාත්මක සාහිත්‍ය රසවින්දනය ඇසුරෙන් ජීවිතයට ලැබෙන අද්දැකීම් සමුදාය අසීමිත ය. එහෙත් වර්තමාන තරගකාරී සමාජයේ බොහෝ දෙනා වින්දනාත්මක හා විචාරශීලී කියවීමෙන් දුරස් වෙමින් සිටිති. නූතන තාක්ෂණ දියුණුව හමුවේ වුව කියවීම් අවකාශ වඩ වඩාත් පුළුල් වී ඇත. ඉන් විපුල පල නෙළා ගෙන සාර්ථක ජීවිතයකට මග හසර එළිපෙහෙළි කර ගත යුතු ය.

(ලකුණු 25 යි)

03 . පහත දැක්වෙන පාඨය වචන **65 -75** අතර වන සේ **සාරාංශ** කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ග්‍රීසිය, රෝමය , භාරතය ආදි වශයෙන් ඈත අතීතයේ දියුණුව පැවති ශිෂ්ටාචාර සතු රටවලට පවා නොමැති භාග්‍යයක් ශ්‍රී ලංකාව සතුව ඇත. එනම් මේ රටේ වර්තමාන ශිෂ්ටාචාරය ආරම්භ වූ සේ සැලකෙන මහින්දාගමනයේ පටන් අඛණ්ඩ ඉතිහාස වාර්තා ආරක්ෂා වී තිබීම ය . එපමණක් නොව ශ්‍රී ලංකාව හා භාරතය අතර සම්බන්ධය තහවුරු කිරීමේ අරමුණු ඇතිව මහින්දාගමනයට පූර්වගාමී ව විශේෂයෙන් බුදුන් වහන්සේ කාලයේ පටන් තොරතුරුත් ඉන් එපිට මහාසම්මත රජු දවස පටන් කරුණුත් අපේ ඉතිහාසය හා සම්බන්ධ කොට වාර්තා වී ඇත්තේ ය. ඒ අතර බුදුන් වහන්සේගේ ලංකා ගමන් තුන ගැන විශේෂ අවධානය යොමු වී තිබේ.

ග්‍රීසියේ හෝ භාරතයේ හෝ ශ්‍රී ලංකාවේ මෙන් අඛණ්ඩ ඉතිහාස වාර්තා තැබීමේ සම්ප්‍රදායක් පැවති බවක් නොපෙනේ. ඒ රටවල සාහිත්‍යයට අයත් වන්නේ වීර චරිත කථා බව කිව යුතු වේ. ග්‍රීක හා භාරතීය මහා ලේඛකයන් වන හෝමර්ගේ ඉලියඩ්, ඔඩිසි යන වීර කාව්‍ය ද ව්‍යාසගේ මහාභාරත,

වාල්මිකිගේ රාමායණ යන වීරකාව්‍ය දෙක ද නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. පාලියෙන් හා සිංහලෙන් සම්පාදනය වී ඇති අපේ ඇතැම් වංසකථා විභාග කිරීමේ දී එහි වීර කාව්‍ය ලක්ෂණ සෑහෙන තරම් අන්තර්ගත වන බව පෙනේ. (ලකුණු 10 යි)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පූර්ව යටත් විජිත යුගයේ කතා කලාව, යටත් විජිත යුගයේ කතා කලාව හා පශ්චාත් යටත් විජිත යුගයේ කතා කලාව යනුවෙන් දළ වශයෙන් ලතින් ඇමරිකානු කෙටිකතා හා නවකතා ඇතුළත් වන කතා කලාව කොටස් කළ හැකි ය. මේ හැම කතා කලාවකින් ම යුගානුරූපී ලක්ෂණ දැකීමට පුළුවන. පූර්ව යටත් විජිත යුගයේ කතා කලාවෙන් ස්වාධීන අදහස් උදහස් දැරූ ජනතාවගේ නිදහස් මතවාදී චින්තනය ප්‍රකට කෙරේ. එසේ ම යටත්විජිත අවධියේ දී නිර්මිත සාහිත්‍ය කෘතිවලින් ජනතාව විඳි පීඩනය දුෂ්කරතා හා ජීවත්වීමේ අරගලය නිරූපණය වේ. යටත් විජිත පාලනය හේතු කොටගෙන රටක දේශපාලන ආර්ථික සාමාජික හා සංස්කෘතික බිඳවැටීම නිසා ජනතාව මුහුණ දෙන අර්බුදය හා අසහනය පශ්චාත් යටත් විජිත සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රතිනිර්මාණය වී ඇත. ලතින් ඇමරිකානු ලේඛකයෝ යුරෝපීය මහා සාහිත්‍ය සම්ප්‍රදායන්ගෙන් ආභාසය ලබා ගැනීමට වැඩි උනන්දුවක් නොදැක්වූහ. කෙටිකතාකරුවන්ට යම්බඳු බලපෑමක් ලැබී ඇත්තේ කෙටිකතාවේ පුරෝගාමියා ලෙස සැලකෙන එඩ්ගා ඇලන්පෝගේ නිර්මාණවලිනි .

(i) ලතින් ඇමරිකානු කෙටිකතා හා නවකතා ඇතුළත් වන කතා කලාවේ කොටස් දෙකක් නම් කරන්න.

(ii) ලතින් ඇමරිකානු කෙටිකතාකරුවන්ට බලපෑමක් ලැබී ඇත්තේ කවරෙකුගේ නිර්මාණ ඇසුරෙන් ද ?

(iii)යටත් විජිත යුගයේ නිර්මිත සාහිත්‍ය කෘතිවලින් නිරූපණය වන්නේ මොනවා ද ?

(iv)පශ්චාත් යටත් විජිත සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රතිනිර්මාණය වී ඇත්තේ කුමක් ද ?

(v) පූර්ව යටත් විජිත යුගයේ කතා කලාවෙන් ප්‍රකට වන මූලික ලක්ෂණ මොනවා ද ?

(ලකුණු 02 X 05 = 10 යි)

5. පහත සඳහන් විස්තරය පදනම් කර ගෙන **රාජකාරි ලිපියක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

නෙළුම්සිරිපුර සාම්ප්‍රදායික කලා භාණ්ඩ නිෂ්පාදකයින් **ශිල්ප කලා නිමැවුම්** නමින් සංවිධානයක් පිහිටුවා ගෙන ඇත. සාමාජික සියලු දෙනාගේ සහයෝගයෙන් නගරය කේන්ද්‍ර කොට ගෙන කලා භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට යෝජනාවක් ඉදිරිපත් වී ඇත. එම සංගමයේ ලේකම් ගිම්හාන් පැහැසර ඔබ යැයි සිතන්න. අලෙවි මධ්‍යස්ථානය පිහිටි ස්ථානයේ ස්වභාවය, නිෂ්පාදනය කරන කලා භාණ්ඩ, එහි මිල ගණන් , සංවිධානයේ අරමුණු ආදි අදාළ තොරතුරු දක්වමින් කලා භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයට විදේශීය සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ඉල්ලමින් කොළඹ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ වෙත යවන **රාජකාරි ලිපිය** ලියන්න.

**නැතහොත්**

පහත විස්තරය පදනම් කර ගෙන **අත්පත්‍රිකාවක්** සකස් කරන්න (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.) අලුත් නුවර නීලෝදය මහා විද්‍යාලයේ නව නිපැයුම් සංගමය මගින් සංවිධානය කරන **සුහුරු විස්කම් දස්කම්** ප්‍රදර්ශනය 2022.12.20 සහ 21 යන දිනවල පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා

විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා වයස් කාණ්ඩ තුනක් යටතේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නව නිපැයුම් ඉදිරිපත් කළ හැකි ය. ජයග්‍රාහකයන් සඳහා වටිනා සම්මාන ත්‍යාග සහ සහතික පත්‍ර ලබා දීමට ද අපේක්ෂිත ය. මේ පිළිබඳ අවධානය යොමු කරමින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම සඳහා සුදුසු අත්පත්‍රිකාවක් සකස් කරන්න. (ඔබ එම නව නිපැයුම් සංගමයේ ලේකම් සහස් සූරියබණ්ඩාර බව සිතන්න).

(ලකුණු 15 යි)

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

21 S III

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II,III
சிங்களமொழியும் இலக்கியமும் I, II,III
Sinhala Language and Literature I, II,III

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- . මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට
-------------------------------------------------------------
නොමියෙන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරම් කෙඳිරියක් මුළු ලොව නිසල කොට

(අ) මෙම කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවිය ඇතුළත් කවි පෙළෙහි රචකයාගේ කවි පළ වූ සඟරාවක නම ලියන්න.

(ii) (අ) ශාන්ති නිකේතන සරසවියේ නිර්මාතෘවරයාගේ නම කුමක් ද?

(ආ) "කල්පනා ලෝකය" ග්‍රන්ථයේ කතුවරයා කවුරු ද?

(iii) කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙවී
ඔහු මෙලොවට පහළ දෙවී
රජෙකැයි සලකනු මැනවී

(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් පද්‍ය සංග්‍රහයේ නම කුමක් ද?

(ආ) මෙම කාව්‍යය රචනා කිරීම කවියා ආරම්භ කළේ කවර ස්ථානයකට යමින් සිටින අතර ද?

(iv) "බුදුහු වනාහී මට හුදු පරලොවින් මැ සඞ්ග්‍රහ කරන්නාහු නො වෙති"

,(අ) මෙහි "මට" යනු කවරෙක් ද?

(ආ) මෙම පාඨය උපුටාගත් කෘතියේ කතුවරයාගේ වෙනත් කෘතියක් නම් කරන්න.

(v) "කොල, ඉතා යහපත් වියෙක ඉස්නෙම් කියා වීථියට දමා පීමී"

(අ) මේ පාඨය උපුටා ගත් කෘතිය රචනා වූ යුගය නම් කරන්න.

(ආ) ඉහත සඳහන් පාඨය උපුටා ගත් මුල් කෘතියේ මූලාශ්‍රය නම් කරන්න.

(vi) (අ) රත්න ශ්‍රී විජේසිංහ කවියාගේ නිර්මාණ මෙහෙවර අගය කරමින් ලියා ඇති කෘතියේ නම කුමක් ද?

(ආ) ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය පළ වූ වර්ෂය කුමක් ද?

(vii) කැර මිණි බරණ රැස්

--------------------------------------------

සුරන් සහ සහසැස්

නො කැර සිටියේ අහස් කුස් හිස්

(අ) ඉහත කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.

(ආ) වීණා වාදනයේ මිහිරෙන් මත් ව මිහි පිටට බැස රැඟුමෙහි යෙදුණු දෙව්ලියන් ගණන කීය ද?

(viii) (අ) "වනසරණ" නම් පරිවර්තන ග්‍රන්ථයේ මුල් රචකයා නම් කරන්න.

(ආ) ලෙනාඩ් වුල්ෆ් මහතා වෙනුවෙන් තැනුණු ලෝකඩ ස්මාරකය පිහිටි ස්ථානයේ නම කුමක් ද?

(ix) (අ) අනුරාධපුර යුගයේ කාව්‍ය ශාස්ත්‍රයට අදාළ ව ලියැවුණු ග්‍රන්ථය නම් කරන්න.

(ආ) ඡන්දස් ශාස්ත්‍රයට අදාළ ව ලියා ඇති සිංහල ග්‍රන්ථය කුමක් ද?

(x) "බුදුහුත් මාගේ ශිල්ප දක්නා කැමැති නියා වනැ යි සතුටු ව ...."

(අ) මේ පාඨය උපුටා ගත් කථා වස්තුව අදාළ කෘතියේ කීවෙනි කථාව ද?

(ආ) "ධම්මපදට්ඨකථාව" කුමන ග්‍රන්ථයක් සඳහා ලියූ අටුවාව ද?

(ලකුණු 02 x 10 =20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ''ජනාකීර්ණ සමහර ගම් මැදින් බිය පත් සිවල් දෙනක මෙන් බියෙන් **ඇලළී ඇකිළී** යන විට ඇගේ මේ තනිකම ඈට දැනුණේ වඩාත් බලවත් ලෙසිනි"

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ) මේ හා සබැඳි අවස්ථාව කෙටියෙන් දක්වන්න.

(ii) "උග්ගසේන සිටු පුත්‍රයාණෝ ද **කර'ග** රහත් වන්නා සේ නො වන බව මුත් හුණදඬු අග දී **පිළිසිඹියා** පත් රහත් ව හුණදණ්ඩෙන් බැස පියා...."

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ) මින් පසු ව වූ සිදුවීම කෙටියෙන් දක්වන්න.

(iii) "වනසිරි පියුම්රා බඳ රනබරණ යුරු
වටපිරි සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිඟු පිරිවැරූ ඔලු'පුලැ'ඹුලවල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු

(අ) මෙහි ඇතුළත් උපමාවක් හා රූපකයක් උපුටා දක්වන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iv) "නුවර මුළුල්ලෙහි රකවල් සකස් කොට ලවා 'රාජාදීහු හයින් දිලිහී ලා හිඳිති. මා උන් අස්වසාලුව මැනවැ යි රජ ගෙයි මතුමාලට නැඟී රජ්ජුරුවන් වැඳ එකත්පස් වැ සිටි සේක."

(අ) රාජාදීහු හයින් දිලිහී ලා සිටීමට හේතුව කුමක් ද?

(ආ) මේ ස්ථානයෙහි රැඳී සිටි අය කවරහු ද?

(v) බැඳි දන මන වැයුමෙහි ඇදුරෝයා
විඳි **සත්සර** වෙණ සර මදුරෝයා
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝයා
වැඳි දන සිරි ගත්තුය කිඳුරෝයා

(ආ) අංකිත පදයේ අර්ථය ලියන්න.

(ආ) මෙම පද්‍යයෙහි විරිත නම් කරන්න. (ලකුණු 04 x 5=20 යි.)

3. අමාවතුර භාෂාවේ,

- සංක්ෂිප්ත බව
- මිනිස් සිත නිරූපණයට යෝග්‍ය බව කැපී පෙනෙන ලක්ෂණ වෙයි. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

හංස සන්දේශයේ කවිවලින්

- සශ්‍රීක පැරණි ගම් පියසක ස්වභාවයත්
- ආගමික හැදියාවෙන් පෝෂිත ජන දිවියත්

මනාව නිරූපණය වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15 යි.)

4. කේවට්ට බමුණාගේ චරිතයෙන් ප්‍රකට වන

- ප්‍රබල චරිත ලක්ෂණ හා
- කැපී පෙනෙන දුර්වලතා ද

පිළිබඳ එක් කරුණකට නිර්දිෂ්ට කොටසින් උදාහරණ දෙක බැගින් සපයමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයේ,

- කවියා ඉදිරිපත් කරන ජීවන දර්ශනය
- අත්දැකීම රසවත් ව ඉදිරිපත් කිරීමට යොදා ගෙන ඇති භාෂාව

පිළිබඳව එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15 යි.)

- **5, 6, 7** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. අදහස් දැක්වීමේ දී ජන කවියා තුළ වූ සංයමය 'හානා හීය පානා අඬහැරෙන් දූනේ' කවි පෙළ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

6. "නාට්‍යකරුවා සිංහබාහු චරිතය මඟින් තරුණයකුගේ අදහස් හා ක්‍රියාකාරිත්වය මනා ව නිරූපණය කරයි." උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

7. "අපටත් වැසිකිළියක්" කෙටිකතාවෙන් නිරූපිත සමකාලීන ගැමි ජන විඥානය කෙබඳු දැ'යි උදාහරණ **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

*****